1968 අංක 25 දරණ

# ප්‍රසිද්ධ විභාග පනත

අනුමතිය ලැබූ දිනය : 1968 ජූනි 16

1968

ලංකා ආණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

## 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත

එල්. ඩී.—ඕ. 13/62

**ප්‍රසිද්ධ විභාග නිසි පරිදි පැවැත්වීම සඳහා ද එබඳු ප්‍රසිද්ධ විභාග සම්බන්ධයෙන් සිදු කරනු ලබන වැරදිවලට දඬුවම් පැමිණවීම සඳහා ද ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ සියලු කරුණු සඳහා ද විධාන් සාර්ථක විධිවිධාන සලස්වනු පිණිස වූ පනතකි.**

[අනුමතිය ලැබූ දිනය: 1968 ජූනි 16]

වර්තමාන පාර්ලිමේන්තුවට රැස් වූ ලංකාවේ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුශාසනය හා අනුමතිය ඇතු ව හා ඇති ව, එහි ම බලය ප්‍රකාර, අත්‍යුත්තම ප්‍රතාපවත් මහා රාජිනිය විසින් මෙ සේ පනවනු ලැබේ :—

1. මේ පනත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත යනුවෙන් හැඳින්විය හැකි ය. — ලුහුඬු නාමය.

2. (1) මෙහි මින් මතු "කොමසාරිස්වරයා" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලබන විභාග කොමසාරිස්වරයා ද, විභාග දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධරයන් ද මේ පනත ක්‍රියාවෙහි යෙදවීම සඳහා වගකිව යුතු ය. — මේ පනත ක්‍රියාවෙහි යෙදවීම.

(2) මේ පනත යටතේ හෝ එය යටතේ පනවනු ලැබූ යම් නියෝගයක් යටතේ වූ ස්වකීය බලතල හෝ යුතුකම් අතුරෙන් කිසිවක් කොමසාරිස්වරයා විසින් විභාග දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්වරයාට හෝ යම් සහකාර කොමසාරිස්වරයකුට හෝ යම් විභාග අධිකාරීවරයකුට පැවරිය හැකි ය.

3. (1) ඒ සඳහා පනවනු ලැබිය හැකි නියෝගවලට අනුකූල ව ඇමතිවරයා විසින් සංස්ථාපනය කරනු ලැබූ පාඨශාලා විභාග උපදේශක කාරක සභාවක් ද කාර්මික විභාග උපදේශක කාරක සභාවක් ද තිබිය යුතු ය. — උපදේශක කාරක සභා.

(2) ඇමතිවරයා විසින්, ඒ සඳහා පනවනු ලැබූ නියෝගවලට අනුකූල ව, යම් විශේෂ ප්‍රසිද්ධ විභාගයක් හෝ ප්‍රසිද්ධ විභාග සමූහයක් සම්බන්ධයෙන් වෙන යම් උපදේශක කාරක සභාවක් සංස්ථාපනය කළ හැකි ය.

4. (1) (3) වන උපවගන්තියෙහි විධිවිධානවලට යටත් ව— — කොමසාරිස්වරයාගේ බලතල.

(අ) උසස් අධ්‍යාපන ආයතනයන්ට අදාළ විභාග හැර පොදු අධ්‍යයන විභාග සහ කාර්මික අධ්‍යයන විභාග ; සහ

(ආ) රජයේ දෙපාර්තමේන්තු විසින් පවත්වනු ලබන වෙන යම් රජයේ විභාග හෝ රජයෙන් ආධාර ලත් ආයතන විසින් පවත්වනු ලබන විභාග

සංවිධානය කොට පැවැත්වීමේ බලය කොමසාරිස්වරයාට තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් විභාගයකින් සමර්ථ වන අපේක්ෂකයන්හට සහතික පත්‍ර හෝ ප්‍රදානයන් නිකුත් කිරීමට කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් විභාග—

(අ) පොදු අධ්‍යයන විභාග සම්බන්ධයෙන්, පාඨශාලා විභාග උපදේශක කාරක සභාවෙහි අදහස් විමසීමෙන් පසු අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද ;

(ආ) කාර්මික අධ්‍යයන විභාග සම්බන්ධයෙන්, කාර්මික විභාග උපදේශක කාරක සභාවෙහි අදහස් විමසීමෙන් පසු අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද ;

(ඇ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් විභාග සම්බන්ධයෙන්, අධ්‍යාපන අධ්‍යක්ෂගේ අදහස් විමසීමෙන් පසු, කාරණයට අදාළ රජයේ දෙපාර්තමේන්තුව විසින් හෝ රජයේ ආධාර ලත් මණ්ඩලය විසින් ද

නියම කරනු ලැබූ පාඨමාලා සහ ග්‍රන්ථ අනුව පැවැත්විය යුතු ය.

ප්‍රසිද්ධ විභාග වල දී අන් කෙනකු මෙන් පෙනී සිටීම.

5. (1) (අ) යම් ප්‍රසිද්ධ විභාගයකට ඉදිරිපත් වීම පිණිස සුදුසුකම් ලත් විභාගාපේක්ෂකයකු නො වී ඊට පෙනී සිටීමට සුදුසුකම් ලත් විභාගාපේක්ෂකයකු වශයෙන් වංචනික ව හෝ වංක ලෙස ඒ විභාගයට පෙනී සිටින, හෝ

(ආ) ඒ විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලත් විභාගාපේක්ෂකයකු ව සිටිමින්, වෙන යම් විභාගාපේක්ෂකයකුහට වෙන් කර දී ඇති විභාග අංකය ස්වකීය උත්තර පත්‍රිකාවෙහි වංචනික ව හෝ වංක ලෙස සටහන් කරන

යම් තැනැත්තකු මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි (ආ) ඡේදය යටතේ විභාග අංකයක් වංචනික ව හෝ වංක ලෙස සටහන් කර ඇති අවස්ථාවක, ඒ ඡේදයෙහි සඳහන් "වෙනත් විභාගාපේක්ෂකයා" ඒ වංචනික ව හෝ වංක ලෙස සටහන් කිරීමේ දී ආධාර දුන්නේ නම්, අනුබල දුන්නේ නම්, හෝ එම වරදෙහිදී නිසොල්මන් ව සිටියේ නම් ඔහු ද මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

ප්‍රශ්න පත්‍ර රහස් ලේඛන විය යුතු බව.

6. (1) යම් ප්‍රසිද්ධ විභාගයක් සඳහා පිළියෙළ කරනු ලබන සෑම ප්‍රශ්න පත්‍රයක් ම, මෙම පනතෙහි කාර්යයන් සඳහා, ඒ ප්‍රශ්න පත්‍රය පිළියෙළ කරනු ලැබූ වේලාවෙහි සිට ඒ විභාගයේ දී අපේක්ෂකයන් විසින් ඒ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම ආරම්භ වීමට නියමිත වේලාවෙහි පටන් පැය බාගයක් ඉකුත් වන තෙක් රහස් ලේඛනයක් විය යුතු අතර, "රහස් ලේඛනය" යන වචන මෙම පනතෙහි මින්මතු යෙදෙන කවර අවස්ථාවක වුව ද එලෙස තේරුම් ගත යුතු ය.

(2) රහස් ලේඛනයක් හෝ එහි කොටසක් භාර දීමට හෝ එබඳු ලේඛනයක හෝ එහි කොටසක අඩංගු කරුණුවලට අදාළ යම් තොරතුරක් සැපයීමට තමාට බලය පැවරී ඇති තැනැත්තකු නො වන වෙන යම් තැනැත්තකුට වංචනිකව හෝ වංක ලෙස ඒ ලේඛනය හෝ එහි ඒ කොටස භාර දෙන හෝ තොරතුරු සපයන යම් තැනැත්තකු මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

උත්තර පත්‍රිකාවලට හෝ ලකුණු ලේඛනවලට අදාළ වින තොරතුරු අනාවරණය කිරීම හෝ ඒ වායෙහි වංචනික ව වෙනස් කිරීම සිදු කිරීම.

7. (1) ප්‍රසිද්ධ විභාගයක් සඳහා පත් කරනු ලැබූ යම් පරීක්ෂකයකු හෝ ඒ විභාගයට අදාළ ලකුණු ලේඛන සම්පූර්ණ කිරීම භාරදෙනු ලැබූ තැනැත්තෙකු උත්තර පත්‍රිකාවලට හෝ ලකුණු ලේඛනවලට අදාළ යම් තොරතුරක්, ඒ තොරතුර අනාවරණය කිරීමට තමාට බලය පැවරුණු තැනැත්තකු නො වන වෙන යම් තැනැත්තකුහට වංචනික ව හෝ වංක ලෙස අනාවරණය කළ හොත්, ඔහු මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) යම් ප්‍රසිද්ධ විභාගයක දී උත්තර පත්‍රිකා එකතු කිරීමේ කාර්යය පවරනු ලබන යම් තැනැත්තකු එබඳු යම් උත්තර පත්‍රිකාවක යම් මැකීම්, පසුව යෙදීම් හෝ වෙන යම් වෙනස් කිරීම් වංචනික ව හෝ වංක ලෙස කළහොත්, ඔහු මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(3) යම් ප්‍රසිද්ධ විභාගයක දී විභාගාපේක්ෂකයින්ගේ ලකුණු ලේඛන පිළියෙළ කිරීමේ, චක්‍ර ගත කිරීමේ හෝ හරි වැරදි බැලීමේ කාර්යය පවරනු ලබන යම් තැනැත්තකු එබඳු යම් ලකුණු ලේඛනයක යම් මැකීම්, පසුව යෙදීම් හෝ වෙන යම් වෙනස් කිරීම් වංචනික ව හෝ වංක ලෙස කළහොත්, ඔහු මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(4) කොමසාරිස්වරයා වෙනුවෙන් යම් ප්‍රසිද්ධ විභාගයක් පවත්වන හෝ පරිපාලනය කරන හෝ එබඳු විභාගයක දී විභාග ශාලාධිපති හෝ අධීක්ෂකයකු වන යම් තැනැත්තකු ඒ විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයීම පිණිස යම් විභාගාපේක්ෂකයකුහට, නියම ලෙස හෝ අනියම් ලෙස වුව ද, වංචනික ව හෝ වංක ලෙස ආධාර කළහොත් හෝ සහාය වුවහොත්, ඔහු මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

රහස් ලේඛන ආදිය සොරකම් කිරීම හෝ ඉවත් කිරීම.

8. යම් ප්‍රසිද්ධ විභාගයක් සම්බන්ධයෙන් යම් රහස් ලේඛනයක් හෝ වෙන යම් ලේඛනයක් මුද්‍රණය කිරීමේ හෝ අතින් හෝ යාන්ත්‍රික උපක්‍රමයකින් සෑදීමේ කාර්යය පවරනු ලැබූ යම් තැනැත්තකු, හෝ ඒ පළමුව සඳහන් තැනැත්තාගේ කාර්යයන්හි දී ඔහුට සහායවීම තම කාර්යය වන යම් තැනැත්තකු වංචනික ව හෝ වංක ලෙස ඒ රහස් ලේඛනය හෝ වෙනත් ලේඛනය හෝ එහි කොටසක් සැඟ වුවහොත්, ගෙන ගියහොත් හෝ ඉවත් කළහොත්, හෝ ඒ රහස් ලේඛනයෙහි හෝ වෙනත් ලේඛනයෙහි හෝ එහි කොටසක පිටපතක් ගතහොත්, ඔහු මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

රහස් ලේඛන ආදිය විනාශ කිරීම හෝ ඒ වාට අයුතු යමක් කිරීම.

9. ප්‍රසිද්ධ විභාගයකට අදාළ යම් රහස් ලේඛනයක් හෝ යම් උත්තර පත්‍රිකාවක්, ලකුණු ලේඛනයක් හෝ වෙනත් ලේඛනයක් භාර ගැනීම, ආරක්ෂා කිරීම හෝ පිටත් කර යැවීම භාර දෙනු ලැබූ යම් තැනැත්තකු එබඳු යම් ලේඛනයක් අඩංගු යම් මුද්‍රා තබන ලද පැකැට්ටුවක්, මිටියක්, පෙට්ටියක්, සේප්පුවක් හෝ වෙනත් භාජනයක් වංචනික ව හෝ වංක ලෙස, කඩා විවෘත කළ හොත් හෝ විනාශ කළ හොත්, හෝ එබඳු යම් ලේඛනයක් හෝ එහි කොටසක් එයින් ඉවත් කර ගතහොත්, ඔහු මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

**රහස් ලේඛන ආදිය වංචනික ලෙස වරදවා භාරදීම.**

10. යම් ප්‍රසිද්ධ විභාගයකට අදාළ යම් රහස් ලේඛනයක් හෝ යම් උත්තර පත්‍රිකාවක්, ලකුණු ලේඛනයක් හෝ වෙනත් ලේඛනයක් භාරදීම හෝ යැවීම පවරනු ලැබූ යම් තැනැත්තකු, ඒ ලේඛනය තමා විසින් භාර දෙනු ලැබීමට හෝ යවනු ලැබීමට තමාට බලය පැවරුණු තැනැත්තකු නො වන යම් තැනැත්තකුට ඒ ලේඛනය වංචනික ව හෝ වංක ලෙස භාර දුනහොත් හෝ යැව්වහොත්, ඒ තැනැත්තා මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

**රහස් ලේඛන ස්වාමිත්වයෙහි තබා ගැනීම හා විකිණීම.**

11. තමාහට ඇති බව ඔප්පු කිරීමේ භාරය තමා විසින් දැරිය යුතු නීත්‍යානුකූල බලයක් ඇතිව හැර, යම් තැනැත්තකු යම් රහස් ලේඛනයක් හෝ එහි පිටපතක් හෝ ඒ ලේඛනයේ කොටසක් හෝ පිටපතක් හෝ රහස් ලේඛනයක් හෝ එහි පිටපතක් යයි හෝ එබඳු ලේඛනයක හෝ පිටපතක කොටසක් යයි අදහස් කරනු ලබන යමක් තම ස්වාමිත්වයෙහි තබා ගතහොත් හෝ බෙදා හැරියහොත් හෝ විකුණුවහොත් හෝ බෙදා හැරීම පිණිස හෝ විකිණීම පිණිස ඉදිරිපත් කළ හොත්, ඔහු මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

**ප්‍රසිද්ධ විභාගයක දී වංක වීම.**

12. (1) යම් ප්‍රසිද්ධ විභාගයක දී යම් ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සපයන විට යම් විභාගාපේක්ෂකයකු වෙන යම් තැනැත්තකුගෙන් වංචනික ව පිටපත් කළ හොත් හෝ එබන්දකු සමග වංචනික ව අදහස් හුවමාරු කර ගත හොත්, හෝ යම් ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයීමේ දී වංක ක්‍රමයක් උපයෝගී කර ගතහොත් ඒ විභාගාපේක්ෂකයා මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) යම් තැනැත්තකු, ප්‍රසිද්ධ විභාගයක දී, වංචනික ව හෝ වංක ලෙස ලියා ඇති හෝ පිළියෙල කොට ඇති යම් උත්තර පත්‍රිකාවක් හෝ එහි කොටසක්, හෝ උත්තර පත්‍රිකාවක් හෝ එහි කොටසක් ය යි අදහස් වන යම් ලේඛනයක්, වංචනික ව හෝ වංක ලෙස, තම ස්වාමිත්වයෙහි තබා ගත හොත් මෙම පනත යටතේ ඔහු වරදකට වරදකරු විය යුතු ය.

**පරීක්ෂකවරුන්ට අදාළ තොරතුරු අනාවරණය කිරීම සහ යම් විශේෂ පරීක්ෂකවරුන් වෙත උත්තර පත්‍රිකා වංක ලෙස යැවීම.**

13. යම් තැනැත්තකු,

(අ) යම් ප්‍රශ්න පත්‍රයක් පිළියෙල කිරීම පිණිස පත් කරනු ලැබූ හෝ පත් කරනු ලැබීමට නියමිත යම් පරීක්ෂකයකු කවුරුන් ද යන්න පිළිබඳ වූ යම් තොරතුරක් හෝ ප්‍රශ්න පත්‍ර හෝ උත්තර පත්‍රිකා යැවීමට අදාළ යම් තොරතුරක්, ඒ තොරතුර දන්වීමට තමාට බලය පැවරුණු තැනැත්තකු නො වන යම් තැනැත්තකුහට වංචනික ව හෝ වංක ලෙස සැපයුවහොත් ; හෝ

(ආ) යම් විශේෂ උත්තර පත්‍රිකාවක්, ඒ උත්තර පත්‍රිකාව යැවීමට තමාට බලය නො පැවරුණු පරීක්ෂකයකු වන යම් විශේෂ පරීක්ෂකයකුහට ලකුණු දැමීමේ කාර්යය සඳහා වංචනික ව හෝ වංක ලෙස යවතහොත් ; හෝ

(ඇ) ප්‍රසිද්ධ විභාගයකට අදාළ ලකුණු හෝ ප්‍රතිඵල අඩංගු හෝ අඩංගු වෙතැයි හැඟෙන යම් ලේඛනයක් තම සන්තකයෙහි තබාගෙන සිටියහොත්

ඒ තැනැත්තා මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

*ව්‍යාජ ලේඛන පාවිච්චි කිරීම.*

14. (1) කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද්දා වූ ද, ව්‍යාජ කිරීමක්, විරූපී කිරීමක් හෝ අන් ලෙසකින් අයුතු යමක් කරන ලද්දා වූ ද යම් ප්‍රතිඵල ලේඛනයක්, සාමාර්ථ්‍යය ලත් විභාගාපේක්ෂකයන්ගේ නාම ලේඛනයක්, සහතික පත්‍රයක් හෝ වෙනත් ලේඛනයක් යම් තැනැත්තකු විසින් නිර්ව්‍යාජ එකක් ලෙස පාවිච්චි කරනු ලැබුවහොත්, ඒ තැනැත්තා මෙම පනත යටතේ වූ වරදකරු විය යුතු ය.

(2) කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ සහතික පත්‍රයක් හෝ වෙනත් ලේඛනයක් වශයෙන් අදහස්වන්නා වූ ද එලෙස නිකුත් කරනු ලැබූ නිර්ව්‍යාජ සහතික පත්‍රයක් හෝ වෙනත් ලේඛනයක් නො වන්නා වූ ද, සහතික පත්‍රයක් හෝ වෙනත් ලේඛනයක් නිර්ව්‍යාජ එකක් ලෙස යම් තැනැත්තකු පාවිච්චි කළ හොත්, ඒ තැනැත්තා මෙම පනත යටතේ වරදකරු විය යුතු ය.

*වැරදිවලට අනුබල දීම.*

15. මෙම පනත යටතේ වරදක් සිදු කිරීම පිණිස වෙනත් තැනැත්තකුහට අනුබල දෙන කවර තැනැත්තකු වුවද මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

*වැරදි සිදු කිරීමට තැත් කිරීම.*

16. මෙම පනත යටතේ වරදක් සිදු කිරීමට තැත් කරන සහ එසේ තැත් කිරීමේ දී ඒ වරද සිදුවීමට යොමු වූ යම් ක්‍රියාවක් කරන යම් තැනැත්තකු වුව ද මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

*මෙම පනත යටතේ වූ වැරදි සඳහා දඬුවම්.*

17. මෙම පනත යටතේ හෝ එය යටතේ පනවනු ලැබූ යම් නියෝගයක් යටතේ වූ සෑම වරදක් ම සුළු අපරාධ විනිශ්චයකරුවකු විසින් සංක්ෂිප්ත ලෙස විනිශ්චය කළ හැකි විය යුතු අතර, එබඳු වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලබන යම් තැනැත්තකු රුපියල් දෙදහසකට වැඩි නො වන දඩයකට සහ එක් අවුරුද්දකට නො වැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට ද යටත් විය යුතු ය.

*වැරදි සංඥේය විය යුතු බව.*

18. අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි කුමක් සඳහන් වුව ද, මෙම පනත යටතේ වූ සෑම වරදක් ම ඒ සංග්‍රහයෙහි අර්ථානුකූල ව එහි කාර්යයන් සඳහා සංඥේය වරදක් විය යුතු ය.

*කොමසාරිස්වරයාගේ අනුමතිය ඇතිව පමණක් නඩු පැවරිය හැකි බව.*

19. මෙම පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමතිය ඇති ව මිස මේ පනත යටතේ නඩු පැවරීමක් නො කළ යුතු ය.

*විනයානුකූල පාලනය සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගේ බලතල.*

20. කොමසාරිස්වරයාට—

(අ) ප්‍රසිද්ධ විභාග සඳහා විභාගාපේක්ෂකයන් වශයෙන් ඉදිරිපත් වන තැනැත්තන් යටත් විය යුතු කොන්දේසි, ව්‍යවස්ථා හා සීමා කිරීම් නියම කිරීමට ;

(ආ) පරීක්ෂකයන්, විභාග නිරීක්ෂකයන්, විභාගාපේක්ෂකයන් සහ ප්‍රසිද්ධ විභාග පැවැත්වීමේ කාර්යය සඳහා කිසියම් අවස්ථාවක දී තමා විසින් සේවයෙහි යොදා ගනු ලබන සියලු ම තැනැත්තන් ද කෙරෙහි, ස්වකීය පරම අභිමතය අනුව, විනයානුකූල පාලනයක් ඇති කිරීමට ;

(ඇ) යම් විභාගාපේක්ෂකයකු (අ) ඡේදයෙහි සඳහන් යම් ව්‍යවස්ථාවක්, කොන්දේසියක් හෝ සීමා කිරීමක් උල්ලංඝනය කර ඇති විට හෝ මෙම පනත යටතේ හෝ එය යටතේ පනවනු ලැබූ යම් නියෝගයක් යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබ සිටින විට, ඒ සම්බන්ධයෙන් පනවනු ලැබිය හැකි පරීක්ෂණයකින් පසු, ඒ විභාගාපේක්ෂකයා විභාගවලට පෙනී සිටීම පිළිබඳ ව, සවකීය පරම අභිමතය අනුව, යම් සීමා කිරීම් හෝ බාධාවන් පැනවීමට හෝ එබඳු විභාගාපේක්ෂයකුහට නිකුත් කරනු ලැබූ යම් සහතික පත්‍රයක් අවලංගු කිරීමට හෝ තහනම් කිරීමට

බලය තිබිය යුතු ය.

රහස්‍යතා දිවුරුම.

**21.** මෙම පනත යටතේ හෝ එය යටතේ පනවනු ලැබූ යම් නියෝගයක් යටතේ යම් යුතුකමක් හෝ කාර්යයක් ඉටු කිරීමෙහි දී හෝ යම් බලයක් පාවිච්චි කිරීමේහි දී හැර, යම් ප්‍රසිද්ධ විභාගයක් සම්බන්ධයෙන් යම් බලයක්, යුතුකමක් හෝ කාර්යයක් බාරදෙනු ලැබූ සෑම තැනැත්තකු ම ඒ විභාගය පිළිබඳ ව, තමාට දැනගත හැකි සියලු කරුණු සම්බන්ධයෙන් රහස්‍යතාව ආරක්ෂා කොට එය ආරක්ෂා කිරීමෙහි ලා සහාය විය යුතු අතර, එය නිවේදනය කිරීමට තමාට බලය පැවරී ඇති තැනැත්තා හැර වෙන යම් තැනැත්තකුට එම කරුණු නිවේදනය කිරීම, හෝ ස්වකීය ස්වාමිත්වයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි පවත්නා යම් රහස් ලේඛනයක් හෝ වෙනෑ ලේඛනයක් බලය නො ලත් කිසියම් තැනැත්තකු වෙත ඉදිරිපත් කිරීම හෝ එබඳු තැනැත්තකුට එබඳු ලේඛනයක් කියවීමට අවසර දීම නො කළ යුතු ය. මෙම පනත යටතේ හෝ එය යටතේ පනවනු ලැබූ යම් නියෝගයක් යටතේ කිසියම් ප්‍රසිද්ධ විභාගයකට අදාළ යම් යුතුකමක් හෝ කාර්යයක් ඉටු කිරීම පිණිස හෝ යම් බලයක් පාවිච්චි කිරීම පිණිස සේවයෙහි යොදවනු ලබන එබඳු සෑම තැනැත්තකු ම, ඒ තත්ත්වයෙහි කටයුතු කිරීමට පෙර, කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබූ ආකෘතිය අනුව පිළියෙළ කරනලද රහස්‍යතා දිවුරුමක් සමාදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු ඉදිරියෙහි දිවුරා එය පිළිගනිමින් අත්සන් කළ යුතු ය. විවිධ තැනැත්තන් විසින් ඉටු කරනු ලැබීමට නියමිත කාර්යයන් අනුව කොමසාරිස්වරයා විසින් ඒ ඒ තැනැත්තා සම්බන්ධයෙන් විවිධ රහස්‍යතා දිවුරුම් ආකෘති නියම කළ හැකි ය.

නියෝග.

**22.** (1) මෙම පනතෙහි ප්‍රතිපත්ති සහ විධිවිධාන පවත්වා ගෙන යාමේ හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ඇමතිවරයා විසින් නියෝග පැනවිය හැකි ය.

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තියෙන් පවරනු ලැබූ බලතලවල සාමාන්‍යත්වයට හානි නො වන පරිදි, පහත සඳහන් කරුණු අතුරෙන් කිසිවක් සඳහා හෝ ඒ සම්බන්ධයෙන් ඇමතිවරයා විසින් නියෝග පැනවිය හැකි ය :—

(අ) නියෝග පනවනු ලැබීමට නියමිත හෝ බලය පවරනු ලැබූ සියලු කරුණු ;

(ආ) ප්‍රසිද්ධ විභාගවල ස්වභාවය හා විෂය ප්‍රමාණය, සහ සාමාර්ථ්‍යය ලත් විභාගාපේක්ෂකයන්හට දෙනු ලැබිය හැකි සහතික පත්‍ර, එබඳු සහතික පත්‍රවල අනුපිටපත් හෝ ප්‍රදානයන් ;

(ඈ) පරීක්ෂකවරුන් පත් කිරීමේ ක්‍රමය සහ ඔවුන්ගේ යුතුකම් හා වේතන, සහ පරීක්ෂකයන් පත් කිරීමේ දී ඔවුන් යටත් විය හැකි මුදල් ගෙවීමේ හා වෙනත් කොන්දේසි ;

(ඇ) ප්‍රසිද්ධ විභාගවල තත්වයට හා ඒ විභාග පැවැත්වීමේ ක්‍රමයට අදාළ සියලු කරුණු ;

(ඉ) (i) පාඨශාලා විභාග උපදේශක කාරක සභාවක ;

(ii) කාර්මික විභාග උපදේශක කාරක සභාවක ; සහ

(iii) නිශ්චිත ව සඳහන් කිසියම් ප්‍රසිද්ධ විභාගයකට හෝ ප්‍රසිද්ධ විභාග සමූහයකට අදාළ ව ඇමතිවරයා විසින් පිහිටුවිය හැකි වෙන යම් කාරක සභාවක

සංයුතිය, ඒ කාරක සභාවල බලතල, යුතුකම් සහ කාර්යයන්,

(3) මෙම පනත යටතේ පනවනු ලැබූ කිසි ම නියෝගයක් උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ, ඒ අනුමතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන තෙක්, ක්‍රියාත්මක නො විය යුතු ය.

23. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම පනතෙහි— අර්ථනිරූපණය.

"පරීක්ෂක" යන්නෙන් ප්‍රසිද්ධ විභාගයක් සම්බන්ධයෙන් "පරීක්ෂක" යන්නෙන් ප්‍රශ්න පත්‍රයක් පිළියෙල කිරීම පිණිස පත් කරනු ලබන තැනැත්තෙක් හෝ උත්තර පත්‍රිකා කියවා බලා ඒවාට ලකුණු නියම කිරීම පිණිස පත් කරනු ලබන තැනැත්තෙක් අදහස් වේ ;

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නට 1966 අංක 20 දරන උසස් අධ්‍යාපන පනතෙහි ඊට දී ඇති අර්ථය ම දී ඇත්තේ ය ;

"ප්‍රසිද්ධ විභාගය" යන්නෙන් මෙම පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි සඳහන් කරනු ලබන යම් විභාගයක් අදහස් වේ ;

"නියෝගය" යන්නෙන් ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගයක් අදහස් වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1002/18 – 1997 නොවැම්බර් 21 වැනි සිකුරාදා – 1997.11.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. –බී. 1/71.

1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත

1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 22 වන වගන්තිය යටතේ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

රිචර්ඩ් පතිරණ,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය.

1997 නොවැම්බර් මස 21 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 1997 අංක 1 දරන ප්‍රසිද්ධ විභාග නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග, ප්‍රසිද්ධ විභාග පනත යටතේ සංවිධානය කරනු ලබන හා පවත්වනු ලබන සියලු ප්‍රසිද්ධ විභාගවලට අදාළ විය යුතු ය. විභාග කොමසාරිස්වරයා මේ නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ ය.

3. (අ) ප්‍රසිද්ධ විභාගයක කාර්ය සඳහා නිරීක්ෂකවරු, ශාලාධිපතිවරු හෝ පරීක්ෂකවරු වශයෙන් පත් කරනු ලබන සියලු තැනැත්තන් සහ ප්‍රසිද්ධ විභාග පනත ප්‍රකාරව, ප්‍රසිද්ධ විභාගයක් සංවිධානය කිරීමෙහි හා පැවැත්වීමෙහි ලා යෙදී සිටින සියලු තැනැත්තන්, කලින් කල නියම කරනු ලැබිය හැකි, කොන්දේසි, රීති හා සීමා මගින් පාලනය විය යුතු අතර, ඒ කොන්දේසිවලට, රීතිවලට හා සීමාවලට අනුකූලව සියලු අවස්ථාවල දී ස්වකීය රාජකාරි හා කර්තව්‍ය ඉටු කරන බවට ඒ තැනැත්තන් වග බලා ගනු ලැබිය යුත්තා හ.

(ආ) (අ) ඡේදයේ සඳහන් තැනැත්තන් පාලනය වන කොන්දේසි, රීති හා සීමා, මධ්‍යම ආණ්ඩුවේ හෝ පළාත් සභාවල අධ්‍යාපන සේවාවල සේවයෙහි නියුක්ත තැනැත්තන්ගේ කොන්දේසිවල, රීතිවල හා සීමාවල කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය. නිරීක්ෂකවරුන්, ශාලාධිපතිවරුන් හෝ පරීක්ෂකවරුන් වශයෙන් පත් කරනු ලැබූ ඒ තැනැත්තන් 5 වන වගන්තියේ දක්වා ඇති ආකාරයට ස්වකීය පත්වීම් භාර ගත්තා ලද බව දැනුම් දීම අවශ්‍ය නොවන අතර, ඒ අනුව, කොමසාරිස්වරයා විසින් එලෙස පත් කරනු ලැබූ වහාම ඒ තැනැත්තෝ ඒ කොන්දේසිවලට, රීතිවලට හා සීමාවලට යටත් වන්නා හ.

4. 3 වන නියෝගයේ සඳහන් සියලු තැනැත්තන්, ප්‍රසිද්ධ විභාගය පැවැත්වීමේ කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන තමන්ට අදාළ ඒ ඒ විභාග මධ්‍යස්ථානවල හෝ නියම කරනු ලබන වෙනත් යම් ස්ථානයක දී, දිනයේ දී හා වේලාවේ දී පැමිණ සිටිය යුතු අතර, කොමසාරිස්වරයා විසින් තමන් වෙත පවරනු ලබන සියලු රාජකාරි හා කර්තව්‍ය ඒ තැනැත්තන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

5. 3(ආ) නියෝගයේ සඳහන් තැනැත්තන් හැර; නිරීක්ෂකවරුන්, ශාලාධිපතිවරුන් හෝ පරීක්ෂකවරුන් වශයෙන් පත් කරනු ලැබූ සියලු තැනැත්තන් සහ ප්‍රසිද්ධ විභාගයක් සංවිධානය කිරීමෙහි හා පැවැත්වීමෙහි ලා යෙදී සිටින සියලු තැනැත්තන්, ඒ විභාගය පැවැත්වීම සඳහා කොමසාරිස්වරයා විසින් නිශ්චිතව දක්වන ලද දිනයේ දී හෝ එදිනට පෙර ස්වකීය පත්වීම් භාර ගත්තා ලද බව දැනුම් දිය යුතු ය.

6. 4 වන නියෝගය කඩ කරමින් ක්‍රියා කරන, 3 (ආ) නියෝගයේ සඳහන් යම් තැනැත්තෙක් හෝ එසේ ක්‍රියා කරන 5 වන නියෝගය යටතේ තම පත්වීම භාරගත් බවට දැනුම් දී ඇති යම් තැනැත්තෙක්, මේ නියෝග යටතේ වරදකට වරදකරු වන්නේ ය.

7. මේ නියෝග යටතේ යම් වරදක් සිදු කිරීමෙහි ලා වෙනත් යම් තැනැත්තෙකුට අනුබල දෙන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන්නේ ය.

8. මේ නියෝග යටතේ වරදක් සිදු කිරීමෙහි ලා තැත් කරන සෑම තැනැත්තෙක් ම වරදකට වරදකරු වන්නේ ය.

9. මේ නියෝග යටතේ වූ සෑම වරදක් ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ ඒ පනතේ කාර්ය සඳහා සංඥේය වරදක් විය යුතු ය.

10. මේ නියෝගවල කාර්යය සඳහා විභාග කොමසාරිස්වරයා යන්නට යම් අතිරේක කොමසාරිස්වරයකු, නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ යම් සහකාර කොමසාරිස්වරයකු ද ඇතුළත් වේ.

12-161

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.